කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2015

2021 මාර්තු - 2022 ජනවාරි

**සමාජීයවිද්‍යා පීඨය**

**ජනසන්නිවේදනය**

භාෂාව හා සන්නිවේදනය – **MACO - E 2015**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. මානව භාෂාව සතු චින්තනමය කාර්ය හා සාමාජීය කාර්ය පිළිබඳව නිර්වචන ඇසුරින් පැහැදිලි කරන්න.

02. "විවිධ සමාජ අවස්ථා අනුව භාෂා භාවිතයේ ස්වරූපය වෙනස් වේ." මේ කෙරෙහි බලපාන සාධක පිළිබඳ නිදසුන් සහිතව විවරණයක යෙදෙන්න.

03. "ශබ්ද ප්‍රභේද ගුවන්විදුලි මාධ්‍යයේ නිර්මාණශීලීත්වය පුළුල් කරයි." නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

04 "මානවයාගේ අදහස්, ආවේග හා ආශාවන් ප්‍රකාශ කිරීමෙහිලා රූප භාෂාව සතු ශක්‍යතාව ප්‍රබල වූවකි." දෙස්විදෙස් සිනමා නිර්මාණ නිදසුන් වශයෙන් ගෙන පැහැදිලි කරන්න.

05. තෝරාගත් තීරු ලිපි රචකයින් හතර දෙනෙකුගේ නිර්මාණ ඇසුරින් තීරු ලිපි භාෂාවේ නිර්මාණශීලීත්වය පිළිබඳ විවරණයක යෙදෙන්න.

06. "පාඨකයා තුළ රසය සහ ප්‍රඥාව ඇති කිරීම සඳහා භාෂාවට ඇත්තේ විස්මිත හැකියාවකි." ලාංකේය සම්භාව්‍ය සාහිත්‍ය නිර්මාණ ඇසුරෙන් සාකච්ඡා කරන්න.

07. "ජනවහර නිර්මාණකරුවාගේ නිර්මාණශීලීත්වය පුළුල් කරයි." සිංහල ගීත නිර්මාණ නිදසුන් වශයෙන් ගෙන පැහැදිලි කරන්න.

08. පහත සඳහන් මාතෘකා අතරින් හතරක් (04) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

   i. භාෂාවේ ප්‍රභවය පිළිබඳ මතවාද
   ii. පුවත්පත් කතුවැකි භාෂාව
   iii. ප්‍රාදේශිය ව්‍යවහාර
   iv. සංඥාර්ථවේදය
   v. පුවත්පත් සිරස්තල භාෂාව
   vi. භාෂාව හා සංස්කෘතිය

****************************************